**බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

# ටවර් හෝල් රඟහල පදනම

# තනතුරු - ඇබෑර්තු

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය යටතේ පාලනය වන ටවර් හෝල් රඟහල පදනමේ පුරප්පාඩු වී ඇති පහත දක්වා ඇති තනතුරු සඳහා සුදුසුකම් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුරු සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇති ස්ථිර තනතුරු වේ.

## 01. අධ්‍යක්ෂ (නාට්‍ය ප්‍රවර්ධන, අධ්‍යාපන සහ වැඩසටහන්) - (HM 1-1)

**තනතුරු සංඛ්‍යාව - 01**

**01.01 සුදුසුකම් - බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නාට්‍ය හා රංගකලාව/ අධ්‍යාපන/සෞන්දර්ය/කලා/ජනසන්නිවේදන විෂය සම්බන්ධයෙන් උපාධියක් **සමග**

අදාල ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Master) ලබා තිබීම

**01.02 පළපුරුද්ද**

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක "කළමනාකාර" මට්ටමේ තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවක (15) පළපුරුද්ද ලබා තිබීම.

**01.03 සුදුසුකම් - අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා (පහත සඳහන් 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කළමනාකාර (MM) සේවා ශ්‍රේණියෙහි 1 වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර 05 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**01.04 වැටුප් පරිමාණය : රු.140,640-15X4100-202,140/-** (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව)

(උක්ත චක්‍රලේඛය අනුව 2025 වර්ෂයට හිමි වන මූලික වැටුප මසකට රු. 105,399/- ක් වේ. භාණ්ඩාගාරය විසින් අනුමත ජීවන වියදම් දීමනාව ලෙස රු.17,800/- ක් හිමි වේ.)

**01.05 වයස :** අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය.

**01.06 තෝරාගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

**මෙම තනතුරට හිමිවන වරප්‍රසාද**

- භාණ්ඩාගාරය විසින් අනුමත වෘත්තීය දීමනාව ඇතුළු අනෙකුත් සියලු දීමනාවන්
- රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 02/2022 අනුව දුරකථන දීමනාව
- රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රවාහන පහසුකම්

## 02. සහකාර /නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධ්‍යාපන, පර්යේෂණ සහ සංරක්ෂණ) - (MM 1-1)

**තනතුරු සංඛ්‍යාව - 01**

**02.01 සුදුසුකම් - බාහිර අයදුම්කරුවන් සඳහා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නාට්‍ය හා රංගකලාව/ අධ්‍යාපන/සෞන්දර්ය /කලා/ජනසන්නිවේදන විෂය සම්බන්ධයෙන් උපාධියක් ලබා තිබීම.

**02.02 පළපුරුද්ද**

උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්ද ලබා තිබීම.

**02.03 වෙනත් සුදුසුකම්**

පරිගණක භාවිතය සහ ඉංග්‍රීසි භාෂාවෙන් වැඩකිරීමේ හැකියාව

නාට්‍ය හා රංගකලාව හෝ අධ්‍යාපනවේදී විෂයෙන් පශ්චාත් උපාධියක් ලබා තිබීම හා අධ්‍යාපන පර්යේෂණ කටයුතු වල නිරතව සිටීම.

අදාල විෂයට සම්බන්ධ පර්යේෂණ කෘති සම්පාදනය හා දෙමළ භාෂාවෙන් වැඩ කිරීමට ඇති හැකියාව විශේෂ සුදුසුකමක් සේ සලකනු ලැබේ.

**02.04 සුදුසුකම් - අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

**හෝ**

"කනිෂ්ඨ කළමනාකාර" JM සේවා ශ්‍රේණියෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**02.05 වැටුප් පරිමාණය : රු.91,690-10 X2480-15X 3450-168,240/-** (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 අනුව)

(උක්ත චක්‍රලේඛය අනුව 2025 වර්ෂයට හිමි වන මූලික වැටුප මසකට රු.71,730/- ක් වේ. භාණ්ඩාගාරය විසින් අනුමත ජීවන වියදම් දීමනාව ලෙස රු.17,800/- ක් හිමි වේ.)

**02.06 වයස:** අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**02.07 තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

**මෙම තනතුරට හිමිවන වරප්‍රසාද**

- භාණ්ඩාගාරය විසින් අනුමත වෘත්තීය දීමනාව ඇතුළු අනෙකුත් සියලු දීමනාවන්
- රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 02/2022 අනුව දුරකථන දීමනාව

## 03. තාක්ෂණික සහකාර MA 2-1

**තනතුරු සංඛ්‍යාව - 01**

**03.01 සුදුසුකම් - බාහිර අයදුම්කරුවන්**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරනු ලබන ජාතික වෘත්තීය කුසලතා NVQ පහ (05) වැනි මට්ටමට අඩු නොවන්නා වූ පරිගණක මෘදුකාංග හා දෘඩාංග කටයුතුවලට අදාළ තාක්ෂණික පාඨමාලාවක් හදාරා තිබීම.

**03.02 වෙනත් සුදුසුකම්**

පරිගණක මෘදුකාංග හා දෘඩාංග කටයුතු පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම. නාට්‍ය හා රංගකලාව විෂයක් ලෙස හදාරා තිබීම. දෙමළ භාෂාවෙන්/ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමට ඇති හැකියාව විශේෂ සුදුසුකමක් සේ සැලකේ.

**03.03 සුදුසුකම් - අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**03.04 වැටුප් පරිමාණය : රු.50540-10X 540 -7X 630- 4 X 890- 20X 1190 -87,710** (කළමනාකරන සේවා චක්‍රලේඛ 01/2025 අනුව)

(උක්ත චක්‍රලේඛය අනුව 2025 වර්ෂයට හිමි වන මූලික වැටුප මසකට රු. 43,379/- කි. භාණ්ඩාගාරය විසින් අනුමත ජීවන වියදම් දීමනාව ලෙස රු.17,800/- ක් හිමි වේ.)

**03.05 වයස :** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**03.06 තෝරාගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

## 04. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන සේවා ශ්‍රේණිය) MA 1-1

**තනතුරු සංඛ්‍යාව - 01**

**04.01 සුදුසුකම් - බාහිර අයදුම්කරුවන්**

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම **සහ**

අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**04.02 වෙනත් සුදුසුකම්**

පරිගණක භාවිතය හා ඉංග්‍රීසි භාෂාවෙන් වැඩකිරීමේ හැකියාව තිබීම හා නාට්‍ය හා රංගකලාව විෂයක් ලෙස හදාරා තිබීම හෝ එම ක්ෂේත්‍රයේ ප්‍රායෝගික පළපුරුද්ද ලබා තිබීම, ප්‍රාසාංගික කලාවන්ට අදාළ ආයතනයන්හි සේවය කර පළපුරුද්ද ලබා තිබීම සහ දෙමළ භාෂාව පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**සැ.යු.** ඉංග්‍රීසි හා දෙමළ භාෂාවන්ගෙන් කටයුතු කළ හැකි අයෙකු මේ සඳහා තෝරා ගැනෙනු ඇත.

**04.03 සුදුසුකම් - අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

**ප්‍රාථමික ශ්‍රේණිය -** ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ශ්‍රේණයන්හි පහත සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

I. අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේදී සිංහල හෝ දෙමළ භාෂාව, ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත්ව තිබීම

II. ප්‍රාථමික ශ්‍රේණියේ පත්වීම ස්ථිර කර තිබිය යුතු අතර එම ස්ථිර සේවයෙහි වසර 05 ක් අඛණ්ඩව සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**සැ.යු.** ඉංග්‍රීසි හා දෙමළ භාෂාවන්ගෙන් කටයුතු කළ හැකි අයෙකු මේ සඳහා තෝරා ගැනෙනු ඇත.

**04.04 වෙනත් සුදුසුකම්**

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන වෙනත් සුදුසුකම් සපුරා තිබීම.

**04.05 වැටුප් පරිමාණය :** රු.46220-10X 540 -7X 630- 4 X 890- 20X1190 -83390 (කළමනාකරන සේවා චක්‍රලේඛ 01/2025 අනුව)

(උක්ත චක්‍රලේඛය අනුව 2025 වර්ෂයට හිමි වන මූලික වැටුප මසකට රු.40,403/- කි. භාණ්ඩාගාරය විසින් අනුමත ජීවන වියදම් දීමනාව ලෙස රු.17,800/- ක් හිමි වේ.)

**04.06 වයස :** අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**04.07 තෝරාගැනීමේ ක්‍රමවේදය:** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්

**ඉහත තනතුරු වලට අදාළ වෙනත් තොරතුරු**

සේවක අර්ථ සාධක අරමුදල සඳහා - සේව්‍යාගේ දායකත්වය 15%

සේවකයාගේ දායකත්වය 10%

සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල සඳහා සේව්‍යයාගේ දායකත්වය 3%

රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරනු ලබන අය සඳහා උපරිම වයස් සීමා අදාළ නොවේ.

**සෑම ඉල්ලුම්කරුවෙක්ම,**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
- රාජ්‍ය හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවය කරනු ලබන අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මඟින් අයදුම්පත ඉදිරිපත් කළ යුතු ය.

ඉහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තම සුදුසුකම් තහවුරු කෙරෙන සහතික වල පිටපත් සමඟ අයදුම්පත් 2025.09.04 දිනට පෙර පහත දැක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ තමා ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය. ඉදිරියේදී ටවර් හෝල් රඟහල පදනම ස්වයං ආදයම් උත්පාදන ආයතනයක් බවට පත් විය යුතු බැවින් කුසලතාවයෙන්, නිපුණතාවයෙන් සහ කාර්යක්ෂමතාවයෙන් ඉහළ අයදුම්කරුවන් පමණක් අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ටවර් හෝල් රඟහල පදනම,**
**සවිසිරිපාය, අංක 123,විජේරාම මාවත,කොළඹ 07.**